# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

### 2023 ඔක්තෝබර්

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය

### ආදි බුදුසමයෙහි දාර්ශනික පසුබිම හා බෞද්ධ දර්ශනයේ මූලධර්ම - BUPH 18214

I හා II කොටස්වලින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ පැවැති 'ජගන්මාතාවන්දනය' සහ 'යෝගවෘත්තිය' පිළිබඳ හැඳින්වීමක් කරන්න.

02. බහුදේවවාදයෙහි ආගමික හා දාර්ශනික ලක්ෂණ පෙන්වා දෙන්න.

03. ඒකදේවවාදය පදනම් කොටගෙන බ්‍රාහ්මණ යුගය තුළ ආගම සංවිධානය වූ ආකාරය විමර්ශනය කරන්න.

04. කර්මමාර්ගය වෙනුවට ඥානමාර්ගය ඉදිරියට පැමිණි ආකාරය ආරණ්‍යක හා උපනිෂද් යුග ඇසුරින් පරීක්ෂා කරන්න.

05. කිරියවාදී ශාස්තෘවරයකු වශයෙන් හඳුනාගනු ලබන නිගණ්ඨනාතපුත්තයන්ගේ ඉගැන්වීම් පිළිබඳ සමාලෝචනයක් කරන්න.

## II කොටස

06. "මුල් බුදුසමය" යනු කුමක්දැයි පැහැදිලිකොට ඊට අයත් මූලාශ්‍රය සාහිත්‍යය හඳුන්වා දෙන්න.

07. පඤ්චස්කන්ධ විභාගය තුළින් පුද්ගලයාගේ කායික හා මානසික ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

08. සමාජගත ගැටලු පටිච්චසමුප්පන්නව නිර්මාණය වන අයුරු බුදුරදුන් විසින් පෙන්වා දෙන ලද අවස්ථා දෙකක් මූලාශ්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

09. දුක් දුරු කිරීමේ මාර්ගය වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳ දුක්ඛනිරෝධගාමිණිපටිපදා ආර්ය සත්‍යය ඇසුරින් සාකච්ඡා කරන්න.

10. සමකාලීන ආගමික දර්ශනවාදයන්හි අන්තර්ගත වූ පුද්ගල විමුක්ති සංකල්පයට සාපේක්ෂව දුක්ඛනිරෝධ ආර්ය සත්‍යය හෙවත් නිර්වාණය පිළිබඳ විවරණයක් සපයන්න.

********************************